

**රත්නපුර අධ්‍යාපන කලාපය**

**13 ශ්‍රේණිය - පළමු වාරය**

**පෙරදිග සංගීතය**

**කාර්ය පත්‍රිකාව 16**

**(කාලය 2020.06.10 සිට 2020.06.15 දක්වා)**

**ප්‍රශ්න අංක 01 සිට 5 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01.ජයජයවන්ති රාගයේ යෙදෙන වක්‍ර ස්වරය ,
1. රිෂභය 2.මධ්‍යමය 3. කෝමල ගාන්ධාරය 4.කෝමල නිශාදය 5. පංචමය

02. පක්වාජ් අංගයෙන් වැයෙන තාල පදයකි,
1. ත්‍රිතාල් 2. පංජාබි 3. ඒක්තල් 4. චෞතාල් 5. තිලවඩා

03. **මූන්ලයිට්** නම් සොනාටාවෙහි නිර්මාතෘවරයා ,
1. ෆ්‍රැන්ස් පීටර් ශුබර්ට් 2. ලුඩ්විග් බිතෝවන් 3. අමදියස් මොසාර්ට් 4. සෙබස්තියන් බාක් 5. ජෝෂප් හේඩ්න්

04. **හොරණෑවේ** නාදයට සමාන නාදයක් නිකුත්වන බටහිර සංගීත භාණ්ඩය,
1. ට්‍රම්පට් 2. ක්ලැරිනට් 3. ට්‍රොම්බෝන් 4. පිකලෝ 5. ඕබෝ

05. C Augmented Chord එකට අයත් ස්වර වනුයේ,
1. ස ග ප නි 2. ස <u>ගු</u> ප <u>නි</u> 3. ස <u>ගු</u> ම/ 4. ස ග <u>ධ</u> 5. ස <u>ගු</u> ප

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර යොදන්න.**

06. ජයජයවන්ති රාගය පරමේල ප්‍රවේශක රාගයක් මෙන්ම, ..................... රාගයක්ද වේ..

07. වැලපුම් ගී වල නාද මාලාව කතෝලික ජනයා අතර පවතින ............................ වල නාදමාලවට සමාන වේ.

08. **ග්ලොකන්ස්පීල්** නම් සංගීත භාණ්ඩය භාරතීය සංගීතයේ ............................................ නම් සංගීත භාණ්ඩයට සමාන වේ.

09. ජයජයවන්ති රාගයේදී රිෂභයන් දෙකකට මැදිව යෙදෙන ............................ ස්වරය සැමවිටම කෝමල වේ.

10. විචෘතාංගයෙන් වාදනය කරන මාත්‍රා 12ක් සහිත තාලයකි, ....................... තාලය.

**II කොටස**

**සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

**01.** හින්දුස්තානි සංගීතයේ විවිධ ශාස්ත්‍රීය ගායන ශෛලීන් දැකගත හැකිය.

i. ගුණකිරීම් සහිතව ගායනා කරන ගාම්භීර ගායන ශෛලියක් නම් කරන්න.

ii. ඛ්‍යාල් ගායන ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න.

iii. ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

*සැකසීම: • ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය - පැල්මඩුල්ල*
*• ර/ ධර්මපාල මහා විද්‍යාලය - රත්නපුර*
*• ර/ ශ්‍රී රාහුල මහා විද්‍යාලය - ලෙල්ලෝපිටිය*
*• ර/ ධර්මාලෝක විද්‍යාලය - පැල්මඩුල්ල*